
**මාධ්‍ය ප්‍රවණතා**

# චන්ද්‍රිකා තාක්ෂණය

# පුවත්පතට



**සී. පී. කුරුප්පු**

නව තාක්ෂණය නිසා පුවත්පත් කලාවේ හැම වැදගත් අංශයක්ම පසුගිය වසර පහක පමණ කාලය තුළ ඉතා දැඩි වෙනසකට භාජනය වී තිබේ. මෙම අංශ අතර වාර්තාකරණය සංස්කරණය මුද්‍රණය සහ පුවත්පත් දැන්වීම් පළ කිරීමද වෙයි. අන්තර්ජාලය හරහා පුවත්පත් සහ සඟරා ප්‍රකාශයට පත් කිරීමද දැන් ඇරඹී ඇත.

මේ අතර පුවත්පත් කලාව නව තාක්ෂණය සමග කෙතරම් තදින් බද්ධ වුවත් පුවත්පත් කලාවේ වෙනස් නොවන සුවිශේෂ අංශයක් ද වෙයි. එය නම් උසස් ආචාර ධර්ම සහ වටිනාකම් මත පුවත්පත් කලාව පවත්වාගෙන යෑමයි. නව තාක්ෂණයට අනුව පුවත්පත් කලාවේ අනෙකුත් අංශ වෙනස් වෙද්දී ආචාර ධර්ම සහ වටිනාකම් ඉතා සුළු ප්‍රමාණයකින් හෝ වෙනස් නොවී තිබීම ඉතා වටිනා ප්‍රවණතාවකැයි පුවත්පත් කලාවේ විශේෂඥයෝ පවසති.

වෙනස් නොවී පවත්නා වටිනාකම් අතර ප්‍රවෘත්තියක ඇති සාධාරණත්වය සහ නිර්වද්‍යතාව සහතික කිරීමත්, ප්‍රවෘත්ති මත පළකිරීම් සහ පුවත්පත් දැන්වීම් පැහැදිලි ලෙස එකින් එක වෙන් වෙන්ව පවත්වාගෙන යාමත් බෙහෙවින් වැදගත්ය.

පුවත්පත් කලාව තුළ ශීඝ්‍රයෙන් වෙනස් වී ගිය අංශත් කිසිම වෙනසක් නොවූ අංශත් පිළිබඳව ඇමරිකාවේ වැඩියෙන්ම අලෙවිවන පුවත්පත වන "වෝල් ස්ට්‍රීම් ජර්නල්" පුවත්පතේ ප්‍රකාශකයා සහ එම පුවත්පත අයිති ඩව් ජෝන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වන පීටර් කෑන් එම පුවත්පතේ පාඨකයනට ලිපියක් ලියමින් පසුගියද විස්තර කළේය.

"වෝල් ස්ට්‍රීට් ජර්නල්" සුවිශේෂ පුවත්පතකි. එය මූලික වශයෙන් පළවන්නේ ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙනි. ව්‍යාපාරික, මූල්‍ය, කර්මාන්ත තාක්ෂණ සහ දේශපාලන ප්‍රවෘත්තීන් කොටස් වෙළෙඳපොළ තොරතුරුත් එම පුවත්පතේ පළවෙයි.සාමාන්‍ය පුවත්පත්වල පළවන අපරාධ, තඩිහබ, රැස්වීම් වාර්තා ආදිය එහි පළවන්නේ නැත.එහෙත් "වෝල් ස්ට්‍රීට් ජර්නල්"යුරෝපීය සහ ආසියානු මුද්‍රණද සමග ඇමරිකාවේ වැඩියෙන්ම අලෙවි වන පුවත්පතයි. එම පුවත්පතේ 1998 වසරේ දිනක සාමාන්‍ය අලෙවිය .පිටපත් 17,40,400 කි. මේ අතර ඇමරිකාවේ වැඩියෙන්ම අලෙවිවන සාමාන්‍ය පුවත්පත වන 'යූ.එස්.ඒ.ටුඩේ' හි 1998 වසරේ දිනක සාමාන්‍ය අලෙවිය පිටපත් 16.53.400 කි.

"වොල් ස්ට්‍රීට් ජර්නල්" පුවත්පතේ පිටපත් මෙතරම් සංඛ්‍යාවක් එක් මධ්‍යස්ථානයක මුද්‍රණය කර ඇමරිකාව පුරා තිවෙස්, ව්‍යාපාරික ස්ථාන සහ කාර්යාලවලට දිනපතා උදේ එකම වේලාවක් තුළ බෙදා හැරීම කළ හැකි කාර්යයක් නොවේ ය. ඒ සඳහා රට පුරා සුදුසු මධ්‍යස්ථානවල පිහිටුවන පුවත්පත් මුද්‍රණය කරන මධ්‍යස්ථාන මගින් පුවත්පත මුද්‍රණය කර බෙදා හැරීම කළ යුතුව තිබුණි. එහෙත් ඊට පෙර ජය ගත යුතුව තිබූ ලොකු අභියෝගයක් විය. එනම් නිව්යෝක් නුවර "වෝල් ස්ට්‍රීට් ජර්නල්" කාර්යාලයේ දී සැකැසෙන පුවත්පතේ පිටු මුද්‍රණය කරන ස්ථානවලට ගුවන් මගින් යැවීම ද කළ නොහැකි විය.

නව තාක්ෂණයෙන් එම අභියෝගය ජය ගැනිණි. ඇමරිකාවේ වෙස්ටර්න් යූනියන් පණිවුඩ හුවමාරු සමාගම යුද කාර්යයකට නොගත්තා පළමු පණිවුඩ හුවමාරු චන්ද්‍රිකාව වන "වෙස්ටාර් - 1" 1974 වසරේ දී උඩු ගුවනේ ස්ථිර කක්ෂයක් රඳවනු ලැබී ය. තම පුවත්පතේ පිටු පුවත්පත මුද්‍රණය කරන ස්ථානවලට යැවීම සඳහා "වෝල් ස්ට්‍රීට් ජර්නල්" පත්‍රය අලුතෙන් බිහිවූ පණිවුඩ හුවමාරු චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගත්තේ ය. එම තාක්ෂණය හරහා පුවත්පත් පළකිරීමේ කාර්යය මුල් වරට ලොව ක්‍රියාත්මක කළේ වෝල් ස්ට්‍රීට් ජර්නල් පත්‍රය යි. ඒ 1975 නොවැම්බර් මාසයේ දී ය. පුවත්පත් පිටු චන්ද්‍රිකාවක් යොදාගෙන මුද්‍රණ මධ්‍යස්ථානවලට යැවීමේ පණිවුඩ හුවමාරු ජාලය එදා නිර්මාණය කළේ අද "ජී ටී ඊ ස්පේස්නෙට්" නමින් හැඳින්වෙන ඇමරිකා චන්ද්‍රිකා සමාගම යි.

"යූ.ඇස්. ඒ. ටුඩේ". ඉන්ටර්නැෂනල් හෙරල්ඩ් ට්‍රිබියුන්, හින්දු වැනි පුවත්පත් රැසක් අද මෙම තාක්ෂණය උපයෝගී කර ගෙන තම පුවත්පත් පළකරයි. පුවත්පත් කාර්යාලයේ සිට චන්ද්‍රිකාවක් හරහා එක් කළු සුදු පිටුවක් මුද්‍රණ මධ්‍යස්ථානය වෙත යැවීමට විනාඩි තුන හමාරක පමණ කාලයක් ගත වෙයි. වර්ණ හතරක් සහිත පිටුවක් එසේ යැවීමට ගත වන කාලය විනාඩි හය හමාරේ සිට දහය පමණ වෙයි. පිටුවක අඩංගු දෑ අනුව යවන කාලය වෙනස් වෙයි. වෝල් ස්ට්‍රීට් ජර්නල් පුවත්පත් ආයතනයට නිව්යෝර්ක් නුවරින් යවන පිටු එක් කර තම පුවත්පත මුද්‍රණය කිරීමේ මධ්‍යස්ථාන 17 ක් ඇමරිකාවේ ඇත.

*පුවත්පත්. කලාව නව තාක්ෂණය සමග කෙතරම් තදින් බද්ධ වුවත් පුවත්පත් කලාවේ වෙනස් නොවන සුවිශේෂ අංශයක් ද වෙයි. එය නම් උසස් ආචාර ධර්ම සහ වටිනාකම් මත පුවත්පත් කලාව පවත්වාගෙන යෑමයි. නව තාක්ෂණයට අනුව පුවත්පත් කලාවේ අනෙකුත් අංශ වෙනස් වෙද්දී ආචාර ධර්ම සහ වටිනාකම් ඉතා සුළු ප්‍රමාණයකින් හෝ වෙනස් නොවී තිබීම ඉතා වටිනා ප්‍රවණතාවකැයි පුවත්පත් කලාවේ විශේෂඥයෝ පවසති.*

පුවත්පත යුරෝපයේ සහ ආසියාවේ මුද්‍රණය කිරීමේ මධ්‍යස්ථාන 14 ක් තිබේ.

තම පුවත්පත ගැන අදහස් දක්වමින් පීටර් කෑන් මෙසේ කීය.

වෝල් ස්ට්‍රීට් ජර්නල් පුවත්පතේ වෙනස ඇරඹුනේ පුවත්පත දිනපතා නිර්මාණය කිරීමේ කාර්යයට මුලින් ම අත ගසන අපේ වාර්තාකරුවන් ගෙනි. අපේ ආර්ථිකයේ සිටින ඔබ වැනි වෘත්තිකයන්ගේ වගේ ඇතැම්විට අපේ වාර්තාකරුවන්ගේත් වැඩ කරන ජීවිතයෙහි දැන් ලොකු වෙනසක් සිදුවී ඇත. ඒ වෙනස ඇරඹුනේ සෙල්ෆෝන්, ලැප්ටොප් කොම්පියුටර්, විද්‍යුත් තැපැල, පොදු අන්තර්ජාලය සහ අපේ අන්තර්ජාලයෙන් ලබා ගන්නා තොරතුරු වලිනි. අපේ නම් ඔය කියන උපකරණ පාවිච්චියෙන් අපේ ලිපි සකස් කිරීමේ කටයුතු ඉක්මනටත් කාර්යක්ෂමවත් කළ හැකිසි. එසේම ඒ ලිපි ලෙහෙසියෙනුත්, මුද්‍රණය කළ යුතු කාලය කිට්ටු වෙන තෙක් බලා සිට එයට අලුත් කරුණු එක් කිරීමට අවශ්‍ය නම් එයත් කර සංස්කරණය කළ හැකිසි.

මෙම උපකරණ නිසා වාර්තාකරුවනට සහ තීරු ලිපි ලේඛකයනට දුර බැහැර සිට තම රාජකාරියේ යෙදීමට පුළුවනි. ඒ මගින් ඔවුන් එවන ලිපි ලේඛන සමඟ පමණක් නොව ඔවුන් සමඟත් අපට වඩාත් සමීප විය හැකි ය. තම නිවෙස් අසල සිටිමින් තම කටයුතුවල යෙදීමට ඔවුනට මේ නිසා කදිම අවස්ථාවක් සැලැසෙනවා පමණක් නොව තම පවුලේ අය සමීපයේ සිටිමින් කටයුතු කරන කුසලතා ඇති එවැනි අයගේ සේවය ලබා ගැනීමට ද අපට අවස්ථාව ලැබෙයි.

"නව උපකරණ නිසා සිද්ධියක් සිදු වන ස්ථානයේ සිටම අපට එහි වාර්තා ලබා ගැනීමට හැකි වෙයි. කොසෝවෝ හෝ මොන්ටෙනෙග්‍රෝ වැනි ස්ථානවල සිට චන්ද්‍රිකා පණිවුඩ ජාලය ඔස්සේ අපේ වාර්තාකරුවෝ හෙට පුවත්පතට වාර්තා සපයති.

"තමා වෝල් ස්ට්‍රීට් ජර්නල්හි තරුණ වාර්තාකරුවකු ලෙස මීට වසර 29 කට පෙර බංග්ලාදේශයේ සේවය කළ කාලයේ තම වාර්තාවක් යුද්ධයට මැදිවී තිබූ නගරයෙන් පිටවන අන්තිම ගුවන් යානයෙන් රැගෙන යන ලෙස අමුත්තකුගෙන් ඉල්ලා සිටීමට සිදු වී යැයි පීටර් කෑන් පැවැසී ය. එම වාර්තාව පුවත්පතේ පළ වී ඇත්තේ එය ලියා දින තුනකට පසුවයි. අද නම් එම ලිපිය චන්ද්‍රිකා පණිවුඩ ජාලය හරහා පුවත්පත යැවීම, ලබා ගැනීම, සංස්කරණය කිරීම සහ පුවත්පතේ පළකිරීම යන සියලු කාර්යයන්ට ගත වන්නේ පැය කිහිපයක පමණ සුළු කාලයකැයි ඔහු කීය.

*මෙම උපකරණ නිසා වාර්තාකරුවනට සහ තීරු ලිපි ලේඛකයනට දුර බැහැර සිට තම රාජකාරියේ යෙදීමට පුළුවනි. ඒ මගින් ඔවුන් එවන ලිපි ලේඛන සමඟ පමණක් නොව ඔවුන් සමඟත් අපට වඩාත් සමීප විය හැකි ය. තම නිවෙස් අසල සිටිමින් තම කටයුතුවල යෙදීමට ඔවුනට මේ නිසා කදිම අවස්ථාවක් සැලැසෙනවා පමණක් නොව තම පවුලේ අය සමීපයේ සිටිමින් කටයුතු කරන කුසලතා ඇති එවැනි අයගේ සේවය ලබා ගැනීමට ද අපට අවස්ථාව ලැබෙයි.*

පීටර් කෑන් මෙසේ ද පැවැසීය.

අද ලියැවෙන ඇතැම් වැදගත් ප්‍රවෘත්තිවලට අදාළ තොරතුරු හෙළිදරව් කර ගත හැක්කේ තාක්ෂණයට පමණි. පසුගිය වසරේ වූ ෆයර්ස්ටෝන් ටයර් ආපසු ගැනීමේ සිද්ධිය ගනිමු. පාරිභෝගිකයන් ඉදිරිපත් කර තිබූ පැමිණිලි 1450 ක් විශ්ලේෂණය කිරීම පිණිස අපේ වාර්තාකරුවෝත් කතුවරුනුත් කොම්පියුටර ආධාර කර ගත් වාර්තාකරණ ක්‍රමෝපායක් යොද ගත්හ. ටයර් ආපසු ගනු ලැබූ වාහනවලින් වැඩිම ආපද සංඛ්‍යාවක් ගැන පැමිණිලි ලැබී තිබුණේ 'ෆෝඩ් එක්ස්ප්ලෝරර්' වර්ගයේ වාහනවලින් බවත් අඩුම පැමිණිලි ගණන ලැබී ඇත්තේ 'ෆෝඩ් රේන්ජර්' වාහනවලින් බවත් ඔවුනට හෙළිදරව් කර ගැනීමට හැකි විය."

වාර්තාකරුවන් ළඟට කතුවරුන් (ශ්‍රී ලංකාවේ නම් උප කතුවරුන්) වැදගත් වෙයි. ඔවුනගේ වැඩ කටයුතු ද තාක්ෂණය නිසා ලොකු වෙනසකට භාජනය වී ඇත.

එම වෙනස ගැන පීටර් කෑන් මෙසේ අදහස් දක්වී ය.

"ඇමරිකාවේ අප වගේ මුද්‍රිත පුවත්පතට ජේජනයිසේෂන් නමැති ක්‍රමය පසුගිය වසරේදී අපි හඳුන්වා දුන්නෙමු. මෙම ක්‍රමය නිසා පුවත්පතේ ආකෘතිය, පිටු සැකැස්ම සහ හැඩ ගැන්වීම නිෂ්පාදන අංශයේ සේවකයන් අතින් තවදුරටත් සිදු නොවෙයි. ඒ වෙනුවට එම කාර්යයන් කෙරෙන්නේ වාර්තා කළ යුතු ප්‍රවෘත්ති මොනවාද ඒවා කළ යුත්තේ කෙසේද වැනි වැදගත් තීරණ ගනු ලබන කතුවරුන් විසිනි. මෙම තාක්ෂණය නිසා ප්‍රවෘත්ති නිෂ්පාදන කාර්යයේ අවස්ථා තුනක් ඉවත් කර දැමීමට අපට හැකි විය. එද පිටු සැකසීමේ අංශයේ ගත කිරීමට සිදු වූ කාලය අද අලුත් ප්‍රවෘත්ති සෙවීමටත් ඒවා සංස්කරණය කිරීමටත් යොද ගත හැකිය.

"අද ඇමරිකාවේ වෝල් ස්ට්‍රීට් ජර්නල් පුවත්පත හෝ ලොව අනෙක් පෙදෙස්වල අලෙවි වන 'වෝල් ස්ට්‍රීට් ජර්නල් යුරෝප්' සහ 'වෝල් ස්ට්‍රීට් ජර්නල් ඒසියා' යන පුවත්පත් හෝ නිකම්ම මුද්‍රිත පුවත්පත් නොවේ. මේ පුවත්පත් සියල්ලම අද වෙනස් වී ඇත. ඒ වෙනසට හේතුව මෑතදී ඇති වූ තාක්ෂණ දියුණුවයි.

පසුගිය වසර කිහිපය තුළදී අපි කැපී පෙනෙන ප්‍රකාශන දෙකක් හෙළි දක්වූයෙමු. ඒවා ව්‍යුහයෙන් 'වෝල් ස්ට්‍රීට් ජර්නල්' පුවත්පතට සමානය. එහෙත් ඒවා එළි දක්වනු ලැබුවේ සම්පූර්ණයෙන් වෙනස් පාඨක පිරිසකට ය. එම නව පුවත්පත් දෙක නම් 'වෝල් ස්ට්‍රීට් ජර්නල් සන්ඩේ' සහ 'වෝල් ස්ට්‍රීට් ජර්නල් ඇමරිකාස්' න් ය. මේ පුවත්පත් දෙකේම ඇත්තේ අපේ මුල් පුවත්පතෙන් ලබාගත් ප්‍රවෘත්තිය. එපමණක් නොව එම පුවත්පත්වල ඇත්තේ ද මුල් පුවත්පතේ පෙනුම සහ තිමාවයි. එහෙත් මෙම පුවත්පත් පළ වන්නේ වෙනත් පුවත්පත්වල ව්‍යාපාර විශේෂාංගය කොටස් ලෙසිනි.

දකුණු ඇමරිකාවේ හැම ප්‍රධාන පුවත්පතක් සමඟම පාහේ බෙද හරිනු ලබන 'ජර්නල් ඇමරිකාස්' පුවත්පත ස්පාඤ්ඤ සහ පෘතුගීසි භාෂාවලින් පළවෙයි. 'සන්ඩේ ජර්නල්' පත්‍රය වැඩි අවධානය යොමු කරවන්නේ පෞද්ගලික මූල්‍ය කටයුතුවලට සහ වෘත්තීන්ට අදාළ ප්‍රවෘත්ති ගෙන ඒමට ය. මෙම පුවත්පත ඇමරිකාවේ වෙනත් ප්‍රධාන පුවත්පත්වල ව්‍යාපාරිකයන් සඳහා වන විශේෂාංගයක් ලෙස බෙදහරිනු ලැබේ. මෙම පුවත් දෙකම ව්‍යාප්ත වෙමින් ඇත.

නව තාක්ෂණ වෙනස්කම් නොතිබුණා නම් මෙම පුවත්පත් දෙක ඇරඹීම කළ නොහැකි වන්නට ඉඩ තිබුණි. අපේ සංස්කරණ ක්‍රමයේත් ජේජනයිසින් ක්‍රමයේත් දියුණුව නිසා අපේ ඉංග්‍රීසි වාර්තා සහ ලිපි සංස්කරණය කරන අතරම ඒවා ස්පාඤ්ඤ සහ පෘතුගීසි භාෂාවලට පරිවර්තනය කළ හැකිය. ඒ සමඟ ඒ භාෂා දෙකෙන් සකස් කළ පිටු අන්තර්ජාලය හරහා අපගේ හවුල්කාර පුවත්පත්වල මුද්‍රණ අංශවලට යැවීමටත් අපට හැකියාව ලැබී ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ අපේ ප්‍රධාන ප්‍රවෘත්ති බොස්ටන් බ්‍රසල්ස් සහ බෙයිජිං යන නගරවලට ලැබෙන දිනයේම ඒවා බුවනෝස් අයර්ස් බ්‍රසීලියා සහ බොගොටා යන නගරවලටත් ලැබීමයි. නව තාක්ෂණය නිසා අපට ක්‍රියාත්මක කළ හැකිවූ විස්මිත නිර්මාණය වන්නේ WSJCom හි පිහිටුවනු ලැබ ඇති වෝල් ස්ට්‍රීට් ජර්නල් ඔන්ලයින් පුවත්පතයි. මෙම පුවත්පත ඇරඹීමේ පස් වැනි සමරුව මේ වසරට යෙදෙයි. ඉකුත් සැප්තැම්බර් මාසය වන විට මෙම පුවත්පතට මුදල් ගෙවා දායක වී සිටින්නන්ගේ ගණන 5,00,000 කි. මෙය මුළු මහත් W.W.W. වෙබ් අඩවිය තුළ සිටින එක් පුවත්පතක් සඳහා මුදල් ගෙවා දායක වී සිටින වැඩිම පිරිසයි.

අපගේ ඔන්ලයින් පුවත්පත අපේ මුල් පුවත්පතේ ඇතුළත් ප්‍රවෘත්ති සහ ලිපි බෙද හරින තවත් ක්‍රමයක් පමණක් නොවේ. එය නව මාධ්‍යයක් සඳහා වන නව ප්‍රකාශනයකි. ❑